# අ.පො.ස.(උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

**ව්‍යාපාර අධ්‍යයනය I** | පැය දෙකයි

සැලකිය යුතුයි :
* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
* අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.

**1.** ව්‍යාපාරයක පදනමට අදාළ මූලිකාංග අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර කුමක් ද?
(1) ගනුදෙනුකරු/ලාභය/නිෂ්පාදිතය/අවශ්‍යතා - වුවමනා
(2) ගනුදෙනුකරු/අවශ්‍යතා - වුවමනා/නිෂ්පාදිතය/ලාභය
(3) ලාභය/නිෂ්පාදිතය/අවශ්‍යතා - වුවමනා/ගනුදෙනුකරු
(4) නිෂ්පාදිතය/ලාභය/ගනුදෙනුකරු/අවශ්‍යතා - වුවමනා
(5) අවශ්‍යතා - වුවමනා/ලාභය/ගනුදෙනුකරු/නිෂ්පාදිතය (........)

**2.** පාසල් සිසුන් ප්‍රවාහනය සඳහා යොදා ගන්නා නිමල් ගේ වාහනයට ජපානයෙන් ආනයනය කරන ලද නවතම ටයර් යුගලයක් මිල දී ගන්නා ලදී. එය අයත් වනුයේ,
(1) පහසු භාණ්ඩවලට ය. (2) සාප්පු භාණ්ඩවලට ය. (3) විශේෂිත භාණ්ඩවලට ය.
(4) ව්‍යාපාර භාණ්ඩවලට ය. (5) නොසෙවු භාණ්ඩවලට ය. (........)

**3.** පහත වගුවේ X හා Y වලින් පිළිවෙළින් නිෂ්පාදන අංශ සහ ඒවායේ උප අංශ දැක්වේ.

| X | Y |
|---|---|
| A කෘෂිකාර්මික නිෂ්පාදන<br>B කාර්මික නිෂ්පාදන<br>C සේවා නිෂ්පාදන | 1. ධීවර කර්මාන්තය<br>2. වන හා දැව කර්මාන්තය<br>3. පතල් හා කැනීම්<br>4. ප්‍රවාහන හා සන්නිවේදන<br>5. විදුලිය, ගෑස්, ජලය<br>6. බැංකු, රක්ෂණ, දේපළ වෙළෙඳාම |

X හා Y නිවැරදි ව ගැළපූ විට නිවැරදි යුගල කාණ්ඩය කුමක් ද?
(1) A - 1, 3 B - 2, 5 C - 4, 6
(2) A - 1, 3 B - 2, 4 C - 5, 6
(3) A - 1, 2 B - 3, 5 C - 4, 6
(4) A - 1, 4 B - 2, 3 C - 5, 6
(5) A - 1, 3 B - 2, 6 C - 4, 5 (........)

**4.** ව්‍යාපාරයක් සමාජ වගකීම් ඉටුකළ යුතු පාර්ශව සහ ඊට අදාළ කාර්යයන් පිළිවෙළින් X හා Y ලෙස වගුවේ දැක්වේ.

| X | Y |
|---|---|
| A සමාජය | 1. සමානාත්මතාව |
| B ගනුදෙනුකරු | 2. සාධාරණ ඉපයීම |
| C අයිතිකරුවන් | 3. අපද්‍රව්‍ය කළමනාකරණය |
| D සේවකයන් | 4. සාධාරණ මිල |

X හා Y නිවැරදිව ගැළපූ විට නිවැරදි යුගල කාණ්ඩය කුමක් ද?
(1) A - 1 B - 2 C - 3 D - 4
(2) A - 4 B - 3 C - 2 D - 1
(3) A - 2 B - 3 C - 1 D - 4
(4) A - 3 B - 4 C - 2 D - 1
(5) A - 1 B - 2 C - 4 D - 3 (........)

**5.** මූල්‍ය ප්‍රතිපත්තියට සහ පිස්කල් ප්‍රතිපත්තියට අදාළ අයිතම පහත දැක්වේ.
A - පොළී අනුපාත
B - වර්තන වියදම් පාලනය
C - බදු සහ දඩ මුදල්
D - විවට වෙළෙඳපොළ කටයුතු

මේවායින් මූල්‍ය ප්‍රතිපත්තියට සහ පිස්කල් ප්‍රතිපත්තියට අදාළ අයිතම **පිළිවෙළින්** දක්වා ඇත්තේ,
(1) A, B සහ C, D තුළ ය. (2) A, C සහ B, D තුළ ය. (3) A, D සහ B, C තුළ ය.
(4) B, C සහ A, D තුළ ය. (5) B, D සහ A, C තුළ ය. (........)

**6.** පහත වගුවේ X වලින් ප්‍රමිති සංකේත දැක්වෙන අතර, Y වලින් ප්‍රමිති නාම දැක්වේ.

| X | Y |
|---|---|
| A ISO 9001 : 2008 | 1. ආහාර ආරක්ෂණ කළමනාකරණය |
| B ISO 14001 : 2004 | 2. තොරතුරු ආරක්ෂණ කළමනාකරණය |
| C ISO 22000 : 2005 | 3. වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිත කළමනාකරණය |
| D ISO 27000 | 4. පරිසර කළමනාකරණ පද්ධති |
| E OHSAS 18001 : 2007 | 5. තත්ත්ව කළමනාකරණ පද්ධති |

ඉහත තොරතුරු නිවැරදිව ගළපා ඇති පිළිතුර කුමක් ද?
(1) A - 1 B - 2 C - 3 D - 4 E - 5
(2) A - 1 B - 3 C - 4 D - 5 E - 2
(3) A - 5 B - 4 C - 2 D - 1 E - 3
(4) A - 5 B - 4 C - 1 D - 2 E - 3
(5) A - 5 B - 3 C - 4 D - 2 E - 1 (........)

**7.**

| X | Y |
|---|---|
| A වරලත් ව්‍යාපාර | 1. ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු තහනම් ය. |
| B රාජ්‍ය සමාගම් | 2. ප්‍රාග්ධනයක් රහිතව ආරම්භ කළ හැකි ය. |
| C ඇපයෙන් සීමිත සමාගම් | 3. රජයේ පාලනය යටතේ පවතී. |
| D මිලකළ සමාගම් | 4. කොටස් වෙළෙඳපලේ ලියාපදිංචි කෙරෙයි. |
| E අක්වෙරළ සමාගම් | 5. ව්‍යාපාර නාමය පුරස්කාරයට යටත් වේ. |

ඉහත X හි ව්‍යාපාර සංවිධාන වර්ග ද, Y හි ඒ හා සම්බන්ධ ප්‍රකාශ ද දැක්වේ. ඒ අනුව, X හා Y නිවැරදිව ගැළපූ විට නිවැරදි යුගල කාණ්ඩය කුමක් ද?
(1) A - 5 B - 3 C - 4 D - 1 E - 2
(2) A - 5 B - 3 C - 2 D - 4 E - 1
(3) A - 5 B - 4 C - 3 D - 1 E - 2
(4) A - 1 B - 2 C - 5 D - 4 E - 3
(5) A - 1 B - 5 C - 2 D - 3 E - 4 (........)

**8.** ලාභ ඉපයීමේ අරමුණ වූ, වගකීම අසීමිත වූ, නීතිමය පුද්ගලභාවයක් සහිත ව්‍යාපාර සංවිධාන **අනුපිළිවෙළින්** දක්වා ඇති නිවැරදි පිළිතුරු කාණ්ඩය
(1) කේවලස්වාමි ව්‍යාපාර/හවුල් ව්‍යාපාර/රාජ්‍ය සංස්ථා
(2) හවුල් ව්‍යාපාර/සීමිත සමාගම්/රාජ්‍ය සමාගම්
(3) හවුල් ව්‍යාපාර/රාජ්‍ය සංස්ථා/සීමිත සමාගම්
(4) රාජ්‍ය සංස්ථා/රාජ්‍ය සමාගම්/හවුල් ව්‍යාපාර
(5) රාජ්‍ය සංස්ථා/හවුල් ව්‍යාපාර/කේවල ස්වාමි (........)

**9.** 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව කොටස් නිකුත් කිරීම සහ කොටස් මත වූ ඇරයුම් කිරීම සම්බන්ධයෙන් සමාගමට ලැබුණු හෝ ලැබිය යුතු හා ගෙවිය යුතු සියලුම මුදල්වල එකතුව
(1) කොටස් ප්‍රාග්ධනය වේ.
(2) නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය වේ.
(3) අවම සහභාග මුදල වේ.
(4) ප්‍රකාශ කළ ප්‍රාග්ධනය වේ.
(5) ආරම්භක කොටස් ප්‍රාග්ධනය වේ. (........)

**10.** භාවිත කරන විදුලිබල ධාරිතාව කිලෝවොට් ඇම්පියර් 50ට අඩු ව්‍යාපාර ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාර වර්ග කිරීමේ නිර්ණායකය ලෙස සලකන ආයතනය
(1) කාර්මික සංවර්ධන මණ්ඩලය වේ.
(2) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව වේ.
(3) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වේ.
(4) ශ්‍රී ලංකා මහ බැංකුව වේ.
(5) කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය වේ. (........)

**11.** පහත දැක්වෙන්නේ මුදලේ කාර්යයන් හා මුදලේ ගුණාංග කිහිපයකි.
A - බෙදෙන සුළු බව
B - විනිමය මාධ්‍යයක් වීම
C - ආරක්ෂණ සංකේත
D - සමජාතීය බව
E - වටිනාකමේ මිම්මක් වීම
F - විලම්භිත ගෙවීම් මාධ්‍යයක් වීම

මින් මුදලේ ගුණාංග පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,
(1) A, B හා F (2) A, C හා D (3) B, C හා D (4) B, E හා F (5) C, D හා E (........)

**12.** රක්ෂණය හා සම්බන්ධ මූල ධර්ම පහත දැක්වේ.
A - රක්ෂ්‍ය හිමිකම
B - උපරිම විශ්වාසය
C - හානි පූර්ණය
D - දායකත්වය
E - ආදේශනය
F - ආසන්නතම හේතුව

ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් අදාළ වන මූලධර්ම පමණක් ඇතුළත් වන්නේ,
(1) A, B හා C වල ය.
(2) A, B හා D වල ය.
(3) A, B හා E වල ය.
(4) A ,B හා F වල ය.
(5) A D හා E වල ය. (........)

**13.** භාණ්ඩ ප්‍රවාහනයේ දී ව්‍යාපාරිකයෙකු සලකා බලන ප්‍රධාන සාධක ඇතුළත් කාණ්ඩය තෝරන්න.

A - පිරිවැය　　B - සුවපහසුව　　C - ධාරිතාව
D - බලය　　E - පර්යන්තය　　F - ආරක්ෂාව

(1) A, B හා F　(2) A, C හා E　(3) A, C හා F　(4) A, D හා E　(5) A, E හා F　(........)

**14.** විදේශ වෙළෙඳාමේ උන්නතියට එරෙහිව විවිධ සාධක බලපානු ලබයි. ඒ අතරෙන් නෛතික බාධාවක් ලෙස **නොසලකන්නේ,**

(1) විනිමය පාලනය ය.　(2) රේගු නීති රීති ය.　(3) ආනයනය තහනම් කිරීම ය.
(4) භාෂාමය වෙනස්කම් ය.　(5) තීරු ගාස්තු ය.　(........)

**15.** පහත වගුවේ X තීරුවේ කළමනාකරණ කාර්යයන් ද Y තීරුවේ ඒ හා සම්බන්ධ කටයුතු ද දැක්වේ.

| X | Y |
|---|---|
| A　සැලසුම්කරණය | 1. විචලනයන් හඳුනාගැනීම |
| B　සංවිධානකරණය | 2. බලතල පැවරීම |
| C　මෙහෙයවීම | 3. නායකත්වය |
| D　පාලනය | 4. උපාය මාර්ග සැකසීම |

X හා Y යුගල ගත කළ විට නිවැරදි කාණ්ඩය කුමක් ද?

(1) A - 4　B - 2　C - 4　D - 3
(2) A - 1　B - 2　C - 3　D - 4
(3) A - 3　B - 2　C - 4　D - 1
(4) A - 4　B - 2　C - 3　D - 1
(5) A - 4　B - 3　C - 2　D - 1　(........)

**16.** තීරණ ගැනීමේ බලතල පහළ මට්ටමේ තනතුරු දරන නිලධාරීන්ට පැවරීම සහ තීරණ ගැනීමේ බලතල ඉහළ කළමනාකාරිත්වය රඳවා ගැනීම **පිළිවෙළින්** හඳුන්වන්නේ,

(1) මධ්‍යගතකරණය හා විමධ්‍යගතකරණය යනුවෙනි.
(2) විමධ්‍යගතකරණය හා මධ්‍යගතකරණය යනුවෙනි.
(3) මධ්‍යගතකරණය හා දෙපාර්තමේන්තුකරණය යනුවෙනි.
(4) දෙපාර්තමේන්තුකරණය හා මධ්‍යගතකරණය යනුවෙනි.
(5) පාලන අවකාශය හා මධ්‍යගතකරණය යනුවෙනි.　(........)

**17.** ව්‍යාපාර සංවිධානයක සම්පත් නාස්තියකින් තොරව හා අවම පිරිවැයකින් පරිහරණය කිරීම හඳුන්වන්නේ,

(1) සඵලතාව ලෙස ය.　(2) කාර්යක්ෂමතාව ලෙස ය.　(3) කාර්ය සාධනය ලෙස ය.
(4) ඵලදායකත්වය ලෙස ය.　(5) තිරසාර සංවර්ධනය ලෙස ය.　(........)

**18.** ''ලක්දිව'' ව්‍යාපාරයෙන් උපුටා ගන්නා ලද වාර්ෂික නිෂ්පාදිත තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| විකුණුම් ඒකක සංඛ්‍යාව | 12 000 |
| මුළු ස්ථාවර පිරිවැය | රු 2 400 |
| ඒකකයක විකුණුම් මිල | රු 60 |
| ඒකක පිරිවැය - සෘජු ද්‍රව්‍ය | රු 20 |
| සෘජු ශ්‍රමය | රු 12 |
| විචල්‍ය පොදු කාර්ය පිරිවැය | රු 12 |
| ස්ථාවර පොදු කාර්ය පිරිවැය | රු 6 |

මෙම නිෂ්පාදිතයේ සම්ච්ඡේදන ඒකක ප්‍රමාණය වන්නේ,

(1) 40　(2) 48　(3) 50　(4) 80　(5) 85　(........)

**19.** ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කරනුයේ,

(1) රඳවා ගැනීමේ පිරිවැය හා මුළු තොග පිරිවැය අවම කර ගැනීමට ය.
(2) මුළු තොග පිරිවැය අවම කිරීමට හා මුළු ඉල්ලුම සොයා ගැනීමට ය.
(3) තොග මිල කිරීමට හා මුළු ඉල්ලුම සොයා ගැනීමට ය.
(4) තොග මිල කිරීමට හා ඇණවුම් පිරිවැය අවම කර ගැනීමට ය.
(5) තොග රඳවා ගැනීමේ හා ඇණවුම් කිරීමේ පිරිවැය අවම කර ගැනීමට ය.　(........)

**20.** නිෂ්පාදන ආයතනයක තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| වාර්ෂික ඉල්ලුම් ඒකක සංඛ්‍යාව | 20 000 |
| එක් ඇණවුමක පිරිවැය | රු 160 |
| එක් ඒකකයක වාර්ෂික ගබඩා පිරිවැය | රු 10 |

ආර්ථික ඇණවුම් ප්‍රමාණය වන්නේ, ඒකක

(1) 400　(2) 800　(3) 1 000　(4) 1 600　(5) 2 000　(........)

**21.** පහත සඳහන් තොරතුරු අතරින් මිල කිරීමේ පරමාර්ථ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

A - වෙළෙඳපොළ තුළ රැඳී සිටීම
B - වෙළෙඳපොළ කොටස උපරිම කිරීම
C - පිරිවැය ඇස්තමේන්තු කිරීම
D - වර්තමාන ලාභ උපරිම කිරීම
E - භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම පුරෝකථන කිරීම
F - වෙළෙඳපොළ සාරය උරා ගැනීම උපරිම කිරීම

(1) A, B, C, D (2) A, B, D, F (3) A, C, D, E (4) A, D, E, F (5) B, C, D, F (........)

**22.** පාරිභෝගික වෙළෙඳපොළ ඛණ්ඩනය කිරීම සඳහා අලෙවිකරුවන් යොදා ගන්නා පාරිභෝගික ගති ලක්ෂණ පහත දැක්වේ.

A - ස්ත්‍රී පුරුෂ බව
B - ආදායම
C - පවුලක ප්‍රමාණය
D - ජීවන රටාව
E - පෞරුෂත්වය
F - වෘත්තිය

මෙයින් ප්‍රජා විද්‍යාත්මක සාධක පමණක් නිවැරදිව ගළපා ඇති පිළිතුර වන්නේ,

(1) A, B, C, D (2) A ,B, C, E (3) A, B, C, F (4) A, C, D, E (5) B, C, D, E (........)

**23.** පහත සඳහන් වන්නේ මූල්‍ය අනුපාත කිහිපයකි.

A - ජංගම අනුපාතය
B - ක්ෂණික අනුපාතය
C - ස්ථාවර වත්කම් පිරිවැය අනුපාතය
D - ණය හා හිමිකාරත්ව අනුපාතය
E - මුදල් අනුපාතය
F - කාල මිණුම

මේවායින් ද්‍රවශීලතා අනුපාත පමණක් අඩංගු වන්නේ

(1) A, B, C, D (2) A ,B, C, F (3) A, B, E, F (4) B, C, D, E (5) A, D, E, F (........)

**24.** පහත වගුවේ X තීරුවේ මූල්‍ය උපකරණ වර්ග කිරීමේ පදනම් ද Y තීරුවේ වෙළෙඳපොළවල් ද දැක්වේ.

| 'X' | 'Y' |
|---|---|
| මූල්‍ය උපකරණවල, | A අතරමැදි වෙළෙඳපොළ |
| 1. කල්පිරීමේ කාලය අනුව | B වෙන්දේසිපොළ<br>C මුදල් වෙළෙඳපොළ |
| 2. බිහිවීම අනුව | D ප්‍රාග්ධන වෙළෙඳපොළ<br>E ප්‍රාථමික වෙළෙඳපොළ |
| 3. ස්වභාවය අනුව | F ද්විතීයික වෙළෙඳපොළ<br>G ණය උපකරණ වෙළෙඳපොළ |
| 4. සංවිධානාත්මක ව්‍යුහය අනුව | H හිමිකම් උපකරණ වෙළෙඳපොළ |

ඉහත X හා Y නිවැරදිව ගළපා ඇති පිළිතුර කුමක් ද?

(1) 1 A B, 2 C D, 3 E F, 4 G H
(2) 1 C D, 2 A B, 3 E F, 4 G H
(3) 1 E F, 2 A B, 3 C D, 4 G H
(4) 1 G H, 2 C D, 3 E F, 4 A B
(5) 1 C D, 2 E F, 3 G H, 4 A B (........)

**25.** මූල්‍ය උපකරණවලට අදාළ ලක්ෂණ පහත දැක්වේ.

A - පරිනතභාවය
B - පොළී අනුපාතිකය
C - සහතිකභාවය
D - හිමිකාරත්වය
E - විශ්වාසනීයභාවය
F - කැඳවුම්භාවය

ඉහත ලක්ෂණ අතරෙන් සාංගමික ණයකර වර්ග කිරීමට යොදා ගන්නා ලක්ෂණ පමණක් ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) A, B, C, D (2) A ,B, C, F (3) B, C, D, E (4) C, D, E, F (5) A, D, E, F (........)

**26.** සේවක ආකර්ෂණ ක්‍රියාවලියට අදාළ වන කාර්යයන් පහත දැක්වේ.

A - රැකියා ඉල්ලුම්පත් සැකසීම
B - ආකර්ෂණයට අදාළ සාධක හඳුනා ගැනීම
C - අභ්‍යන්තර හා බාහිර ආකර්ෂණ මාර්ග තෝරා ගැනීම
D - රැකියා පුරප්පාඩු හඳුනා ගැනීම
E - රැකියාවට අදාළ සාධක හඳුනා ගැනීම
F - ආකර්ෂණ උත්සාහය ඇගයීම
G - ක්‍රියාත්මක කිරීම

ඉහත කාර්යයන්ගේ නිවැරදි අනුපිළිවෙළ වන්නේ,

(1) A, C, B, E, D, F, G (2) A, B, E, C, G, B, F (3) D, E, G, F, A, C, B
(4) D, E, B, A, C, G, F (5) A, D, B, F, C, E, G (........)

**27.** මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධ කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A - අනාගත සේවක අවශ්‍යතා නිගමනය කිරීම
B - උපක්‍රමික සැලසුම් පිළියෙළ කිරීම
C - රැකියාවට අදාළ කාර්යයන් හඳුනා ගැනීම
D - රැකියා ඉල්ලුම්පත් සැකසීම
E - සේවක පිරිවැය පාලනය

මේවා අතරෙන් මානව සම්පත් සැලසුම්කරනයට අදාළ කාර්යයන් අඩංගු පිළිතුර තෝරන්න.

(1) A, B, C (2) A, C, D (3) A, B, E (4) C, D, E (5) B, C, D (........)

**28.** මානව සම්පත් කළමනාකරණයේ දී රැකියා විස්තරයට හා රැකියා පිරිවිතරයට පොදුවේ අදාළ වන වැදගත් ම තොරතුර වනුයේ,

(1) කාර්ය ස්වභාවය යි. (2) තනතුරු ලාභියාගේ සුදුසුකම් වේ. (3) පළපුරුද්ද යි.
(4) තනතුරු නාමය යි. (5) වැටුප් පරිමාණය යි. (........)

**29.** පහත වගුවේ X තීරුවෙන් තොරතුරු පද්ධතියක උපාංග ද, Y තීරුවෙන් උපාංගවලට අදාළ අයිතම ද දැක්වේ.

| X උපාංග | Y අයිතම |
|---|---|
| A දෘඩාංග | 1. නීතිරීති හා ප්‍රතිපත්ති |
| B මෘදුකාංග | 2. මයික්‍රොසොෆ්ට් |
| C ජීවාංග | 3. මොනිටරය |
| D ආයතනිකාංග | 4. පරිශීලක |
| E ක්‍රියාපටිපාටි | 5. වින්ඩෝස් |

ඉහත උපාංග හා ඊට අදාළ අයිතම නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

(1) A - 3 B - 5 C - 4 D - 1 E - 2 (2) A - 3 B - 5 C - 4 D - 2 E - 1
(3) A - 5 B - 3 C - 2 D - 1 E - 4 (4) A - 3 B - 2 C - 4 D - 5 E - 1
(5) A - 3 B - 2 C - 1 D - 5 E - 4 (........)

**30.** පහත වගුවේ X තීරුවේ ව්‍යාපාර සැලැස්මක ඇතුළත් අංග ද Y තීරුවේ ඊට අදාළ උප අංග පහත වගුවේ දැක්වේ.

| X | Y |
|---|---|
| A විධායක සාරාංශය | 1. මුදල් ප්‍රවාහ ප්‍රකාශය |
| B අලෙවි සැලැස්ම | 2. ද්‍රව්‍ය මිලදී ගැනීම |
| C මෙහෙයුම් සැලැස්ම | 3. සේවක අවශ්‍යතා |
| D මානව සම්පත් සැලැස්ම | 4. අලෙවි වියදම් |
| E මූල්‍ය සැලැස්ම | 5. අධ්‍යක්ෂ මණ්ඩල විස්තර |

ඉහත X හා Y තොරතුරු යුගල ගත කළ විට නිවැරදි පිළිතුර කුමක් ද?

(1) A - 1 B - 2 C - 3 D - 4 E - 5 (2) A - 2 B - 3 C - 4 D - 5 E - 1
(3) A - 3 B - 1 C - 2 D - 4 E - 5 (4) A - 5 B - 4 C - 2 D - 3 E - 1
(5) A - 4 B - 3 C - 2 D - 1 E - 5 (........)

- **ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

**31.** (අ) තරගකරුවන්, සැපයුම්කරුවන් ........................................................................ පරිසර සාධක වන අතර, අයිතිකරුවන්, සේවකයන් ............................................................ පරිසර සාධකවලට අයත් වේ.

(ආ) ව්‍යාපාර ඉලක්ක වඩාත් පැහැදිලි කර ලිඛිතව ප්‍රකාශ කළ විට හඳුන්වන්නේ ...................................................... ලෙස ය.

**32.** (අ) පාරිභෝගික අයිතිවාසිකම් නීතියක් ලෙස ප්‍රකාශයට පත්කළ ජනාධිපතිවරයා ............................................ වේ.

(ආ) 2012 මහ බැංකු වාර්තාවට අනුව මුළු රාජ්‍ය ආදායමින් වැඩි ප්‍රතිශතයක් ලැබී ඇති බදු වර්ගය වන්නේ, ......................................................................................................................................... ය.

**33.** (අ) ලාභය අනුව වෙනස්වන පොලියක් ලබන හවුල්කරු ................................................................ නමින් හැඳින්වේ.

(ආ) 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව වෘත්තීය හවුල් ව්‍යාපාරයක උපරිම හවුල්කරුවන් ගණන කොපමණ ද?

......................................................................................................................................... .

**34.** (අ) ව්‍යවසායකයෙකුගේ ප්‍රධාන කාර්යය වන්නේ, ........................................................................................................ ය.

(ආ) කුඩා හා මහා පරිමාණ ව්‍යාපාර තීරණය කරන මිනුම් දඬු පොදුවේ ගත්කළ ........................................ හා ............................................................. ලෙස වර්ග කළ හැකිය.

**35.** (අ) මුදලක ප්‍රධාන ලක්ෂණය .................................................................................. ලෙස දැක්විය හැකි ය.

(ආ) බැංකු දෙකක ගිණුම් දෙකක් අතරේ හුවමාරු වන චෙක්පතකින් ගෙවීම කළ හැකි උපරිම මුදල .............. වේ.

**36.** (අ) පහත සටහනෙහි හිස් කොටු අදාළ පද යොදා සම්පූර්ණ කරන්න.




(ආ) ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලට ගැනීමේ දී හෝ විකිණීමේ දී එම ගනුදෙනු තම පෞද්ගලික නමින් සිදු කරනු ලබන නියෝජිතයා ................................................................................ නමින් හඳුන්වයි.

**37.** (අ) සංවිධානයක අභ්‍යන්තර හා බාහිර පරිසරය පිළිබඳව ඇති අවබෝධය, ගැටලු තේරුම් ගැනීම හා විසඳීමේ හැකියාව, දූරදර්ශීභාවය, තීරණ ගැනීම වැනි තීක්ෂණව සිතීමේ කළමනාකරුවෙකු සතු කුසලතා ................................................................................ ලෙස හඳුන්වයි.

(ආ) සංවිධානයක කළමනාකරුවකුට ලැබෙන නීත්‍යානුකූල බලය ................................................ ලෙස හඳුන්වයි.

**38.** (අ) වෙළෙඳ ලකුණක් ලියා පදිංචි කළ බව මහජනයා වෙත නිල වශයෙන් දැනුම් දෙන්නේ .............................. ..............................................................................................මගිනි.

(ආ) කාර්මික භාණ්ඩ බෙදා හැරීමේ මාර්ග දැක්වෙන පහත සටහනේ හිස්තැන්වලට සුදුසු පද යොදන්න.




[7 වැනි පිටුව බලන්න

**39.** (අ) සැලසුම්කරණයේ දී හා තීරණ ගැනීමේ දී භාවිතයට ගනු ලබන අභ්‍යන්තර මූල්‍ය ඇස්තමේන්තුවක් ලෙස ............................................................................... හැඳින්විය හැකිය.

(ආ) මූල්‍ය ක්‍රමයේ මනා ක්‍රියාකාරිත්වය හා ස්ථායිතාව තහවුරු කිරීම සඳහා අධාර වන ගෙවීම් හා පියවීම් පද්ධති ........................................................................ යටතට ගැනේ.

**40.** (අ) කිසියම් රැකියාවකට අයත් (1) ......................................................., (2) ......................................................., (3) ......................................................., (4) ....................................................... විස්තර කෙරෙන ප්‍රකාශය රැකියා විස්තරය ලෙස හඳුන්වයි.

(ආ) සේවාදායකයා විසින් සිය රැකියාව කොතෙක් දුරට සාර්ථකව ඉටු කරන්නේ දැයි සොයා බලා වාර්තා කිරීමේ ක්‍රියාවලිය ................................................................. ලෙස හඳුන්වයි.

- **ප්‍රශ්න අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

**41.** (අ) කාර්මික විප්ලවයත් සමග වාණිජ්‍යය ක්ෂේත්‍රයට එකතු වූ උපකාරක සේවාවන් **දෙකක්** වනුයේ

........................................................................................................................................ .

(ආ) එක් පුද්ගලයෙකු සතු නිෂ්පාදිතයක් තවත් පුද්ගලයකු වෙත හිමිකමක් සමඟ සිදුවන හුවමාරුව හඳුන්වන්නේ කුමන නමකින් ද?

........................................................................................................................................ .

**42.** (අ) ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳව ඇමරිකා එක්සත් ජනපදයේ (USA ) ජාතික නිර්වචනය කුමක් ද?

........................................................................................................................................ .

........................................................................................................................................ .

(ආ) ජාත්‍යන්තර පාරිභෝගික දිනය කවදා ද?

........................................................................................................................................ .

**43.** ව්‍යවසායකත්වයට අදාළ ක්‍රියාවන් හා ගුණාංග කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1. සැලසුම් කිරීම | 2. ක්‍රියාවට නැංවීම | 3. නව්‍යතා සම්පාදනය |
| 4. අවස්ථා සොයා යාම | 5. ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම් | 6. වර්ධනය |
| 7. ආත්ම විශ්වාසය | 8. නම්‍යශීලී බව | |

මේවා අතරෙන් ව්‍යවසායකත්ව ක්‍රියාවලියට අදාළ ක්‍රියාවන් පමණක් ලියා දක්වන්න.

........................................................................................................................................ .

........................................................................................................................................ .

**44.** හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් පහත කාර්යයන්ට අදාළ නීති, ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියා දක්වන්න.

1. රු 1 000කට වැඩි ප්‍රාග්ධනයක් යෙදීම : ............................................................................ .
2. ලාභ අලාභ බෙදා ගැනීම : ............................................................................ .
3. උපරිම හවුල් කරුවන් සංඛ්‍යාව : ............................................................................ .
4. ව්‍යාජ නමකින් පවත්වා ගෙන යාම : ............................................................................ .

**45.** (අ) මෙරට භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය සඳහා විදේශීය ආයෝජකයන්ට මෙරට වාණිජ බැංකුවල රුපියල් වලින් ආරම්භ කළ හැකි ගිණුම කුමක් ද?

........................................................................................................................................ .

(ආ) ''මිලංකා'' මිල දර්ශකය වෙනුවට මෑත කාලයේ දී හඳුන්වා දුන් නව මිල දර්ශකය කුමන නමකින් හැඳින්වේ ද?

........................................................................................................................................ .

**46.** (අ) පාසල් දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන ''සිසු සැරිය බස් රථ සේවාව'' අධීක්ෂණය හා මෙහෙයවීම සිදු කරන ආයතනය නම් කරන්න.

........................................................................................................................ .

(ආ) නව රූපවාහිනී නාලිකාවක් ආරම්භ කිරීමට අවසර ලබා ගත යුතු ආයතනය කුමක් ද?.

........................................................................................................................ .

**47.** (අ) නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන ක්‍රියාවලිය සංවර්ධනය කිරීම සහ පාලනය කිරීම සඳහා යොදා ගනු ලබන පරිගණක තාක්ෂණ ශිල්පීය ක්‍රමය හඳුන්වන්නේ කුමන නමකින් ද?

........................................................................................................................ .

(ආ)

| | |
|---|---|
| යළි ඇණවුම් මට්ටම ඒකක | 6 000 |
| අවම තොග භාවිතය ඒකක | 2 000 |
| අවම ඇණවුම් කාලය මාස | 02 |
| උපරිම ඇණවුම් කාලය මාස | 03 |
| යළි ඇණවුම් ප්‍රමාණය ඒකක | 10 000 |

උපරිම තොග මට්ටම කොපමණ ද?

........................................................................................................................ .

**48.** (අ) කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් දිගින් දිගටම මිලදී ගන්නා සහ පාරිභෝජනය කරන ගනුදෙනුකරුවන් හා සබැඳි වෙළෙඳපොළ කුමක් ද?

........................................................................................................................ .

(ආ) යම්කිසි නිෂ්පාදකයකු විසින් වෙළෙඳපොළට ඉදිරිපත් කරන භාණ්ඩයක අත්‍යවශ්‍යයෙන් ම ඇතුළත් විය යුතු අංග **දෙකක්** නම් කරන්න.

........................................................................................................................ .

**49.** (අ) කොටස් වෙළෙඳපොළ තුළ ගනුදෙනු සිදුවන ''සමථ දිනයක්'' යනු කුමක් ද?

........................................................................................................................ .

(ආ) කොළඹ කොටස් වෙළෙඳපොළ කටයුතු අධීක්ෂණය හා විධිමත් කිරීමට පාර්ලිමේන්තු පනතක් යටතේ පිහිටුවා ඇති ආයතනය කුමක් ද?

........................................................................................................................ .

**50.** (අ) කිසියම් ආයතනයකට අයත් කාර්ය ස්ථාන (Working Sites) සම්බන්ධ කෙරෙන ආකාරයට සකස් කර ඇති පරිගණක සම්බන්ධතාව කුමක් ද?

........................................................................................................................ .

(ආ) අන්තර්ජාලයේ ප්‍රදර්ශනය කෙරෙන වෙබ් අඩවිවල ඇතුළත් ගොනු (file) පිටපත් කර ගැනීමට අවශ්‍ය යටිතල පහසුකම් සපයන තාක්ෂණය කෙසේ හැඳින්වේ ද?

........................................................................................................................ .

***

## අ.පො.ස.(උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

| | |
|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය II | පැය තුනයි |

සැලකිය යුතුයි :

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

# I කොටස

**1.** (i) 'සුවසිරි' අර්ධ නාගරික විශාල භූමි ප්‍රදේශයක පිහිටි නවීන උපකරණ සහ කාර්යක්ෂම කාර්ය මණ්ඩලයකින් සමන්විත ජනප්‍රිය රෝහලකි.

(අ) මෙම රෝහල සපයන සේවාවේ ස්වභාවය කුමක් ද? (ලකුණු 02යි)

(ආ) භාණ්ඩ සහ සේවා අතර වෙනස්කම් මොනවා ද? (ලකුණු 02යි)

(ii) (අ) ව්‍යාපාරයක ඉලක්ක (අරමුණු) **හතරක්** නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) වර්තමාන ව්‍යාපාර, ගනුදෙනුකරු කේන්ද්‍ර කර ගෙන පවත්වාගෙන යයි. පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(iii) ''ව්‍යාපාර විකාශනයේ දී කාර්මික විප්ලවයෙන් සිදුවූ බලපෑම සුළු පටු නොවේ.''

(අ) කාර්මික විප්ලවය, නිෂ්පාදනයට සහ වෙළෙඳාමට බලපෑම් කළ ආකාර වෙන වෙන ම පහදන්න. (ලකුණු 02යි)

(ආ) විද්‍යුත් වාණිජ්‍ය තුළින් පාරිභෝගිකයන්ට සහ ව්‍යාපාරිකයන්ට ලැබෙන වාසි නම් කරන්න. (ලකුණු 02යි)

(iv) ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන්ගේ බලපෑම් වර්ධනය වෙමින් පවතී.

(අ) ව්‍යාපාර ආයතනයක කටයුතුවලට පරිසරවේදීන් සහ මාධ්‍යවේදීන් බලපෑම් කරන්නේ කෙසේදැ යි වෙන් වෙන් ව දක්වන්න. (ලකුණු 02යි)

(ආ) ශ්‍රම විභජනය සහ විශේෂීකරණය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(v) (අ) ප්‍රාථමික නිෂ්පාදනයේ ඵලදායීතාවය සඳහා ද්විතීයික නිෂ්පාදිත දායක වන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) 2012 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, දළ ජාතික නිෂ්පාදිතයේ කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශවල දායකත්වය (ප්‍රතිශත) දක්වන්න. (ලකුණු 02යි)

(මුළු ලකුණු 20යි)

**2.** (i) පහත සඳහන් වන්නේ රජයක ආර්ථික අරමුණු ඉටුකර ගැනීමේ දී යොදා ගන්නා සංකල්ප කිහිපයකි. එමගින් අපේක්ෂිත දේ වෙන් වෙන් ව පැහැදිලි කරන්න.

(අ) ආර්ථික කාර්යක්ෂමතාවය (ආ) පූර්ණ සේවා නියුක්තිය (ඉ) ආර්ථික වෘද්ධිය

(ඊ) ආර්ථික නිදහස (ලකුණු 04යි)

(ii) (අ) ශ්‍රී ලංකා මහ බැංකුව රටේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී භාවිත කරන ප්‍රමාණාත්මක මූල්‍ය පාලන උපකරණ **දෙක** නම් කරන්න. (ලකුණු 01යි)

(ආ) පාරිභෝගික ජාත්‍යන්තරය ප්‍රකාශ කළ පාරිභෝගික අයිතිවාසිකම් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ඉ) වර්තමාන වෙළෙඳපොළ තුළ පාරිභෝගිකයාට විවිධ වූ අසාධාරණ වෙළෙඳ පිළිවෙත් හා අනතුරුදායක තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වී ඇත. මේ නිසා ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධව ක්‍රියා කිරීමට රජය විසින් පනවා තිබෙන ප්‍රධාන නීතිය කුමක් ද? (ලකුණු 01යි)

(iii) (අ) කේවල ස්වාමි ව්‍යාපාරයකට සාපේක්ෂව හවුල් ව්‍යාපාරයක දැකිය හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) ශ්‍රී ලංකාවේ සමුපකාර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සෘජුව ම සම්බන්ධ වන ආයතන **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි)

(iv) කලන තම පියා විසින් පවත්වාගෙන ගිය සිල්ලර බඩු වෙළෙඳසැල තම මිතුරකු වූ නුවන් සමග එකතු වී සීමා සහිත පෞද්ගලික සමාගමක් ලෙස පිහිටුවීමට තීරණය කරන ලදී.

(අ) එය ලියාපදිංචි කළයුතු පනත හා ආයතනය කුමක් ද? (ලකුණු 02යි)

(ආ) එය පිහිටුවීමෙන් ලැබිය හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 02යි)

(v) (අ) වරලත් ව්‍යාපාර ලෝකය පුරා ව්‍යාප්ත වීමේ හා ජනප්‍රිය වීමේ ප්‍රවණතාවක් පවතී. එසේ ජනප්‍රිය වීමට හේතු දක්වන්න. (ලකුණු 02යි)

(ආ) වරලත් ව්‍යාපාර වර්ග **දෙකක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(මුළු ලකුණු 20යි)

[2 වැනි පිටුව බලන්න

**3.** (i) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යවසායකත්වයේ අවශ්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාරවලට පමණක් ආවේණික ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) උසස් පෙළ විභාගයට පෙනී සිටි නයනමාලිගේ බලාපොරොත්තුව රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමයි. ඒ සඳහා ණය පහසුකම් ලබා දීමට ප්‍රදේශයේ වාණිජ බැංකුවක් කැමැත්ත පළ කර සිටියි. නමුත් ඇය ණය ලබා ගැනීමට බියක් දක්වයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ''උපදේශනා'' ණය උපදේශන කේන්ද්‍රය තුළින් උපදෙස් ලබා ගන්නා ලෙස ගුරුවරයෙක් මඟ පෙන්වයි. නයනමාලිට එම උපදේශන සේවාව කෙසේ වැදගත් වන්නේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) (අ) නිහාල් පාසල් සිසුන් ප්‍රවාහනය කරන වෑන් රථයක රියදුරෙකි. ඔහුගේ ම ''පාසල් සිසු ප්‍රවාහන සේවාවක්'' සඳහා වෑන් රථයක් කල්බදු ක්‍රමය යටතේ ලබා ගැනීමට අදහස් කරයි. කල්බදු ක්‍රමයෙන් නිහාල්ට අත්වන වාසි පෙන්වා දෙන්න. (ලකුණු 02යි)
(ආ) කල්බදු ගිවිසුම් වර්ග නම් කරන්න. (ලකුණු 02යි)

(v) (අ) ණයපත් (Credit Card) භාවිතය ප්‍රචලිත කිරීමට ඇති බාධක මොනවාද ? (ලකුණු 02යි)
(ආ) ණයපත් (Credit Card) භාවිතය තුළින් ව්‍යාපාරිකයන්ට හිමිවන **වාසි** හා **අවාසි** මොනවා ද? (ලකුණු 02යි)
(මුළු ලකුණු 20යි)

**4.** (i) ඉසුරු හා ළහිරු ඉතා සුළුවෙන් ආරම්භ කරන ලද නිමි ඇඳුම් ව්‍යාපාරය, අද වන විට මහා පරිමාණ ඇඟලුම් කම්හලක් බවට පත්ව ඇත. ඔවුන් මුහුණ දෙන අවදානම් **හතරක්** සහ ඒ සඳහා ලබා ගත හැකි රක්ෂණාවරණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(ii) (අ) ''භාණ්ඩ ප්‍රවාහනයේ යෙදෙන නෞකාවක් ඉන්ධන කාන්දුවීම හේතුවෙන් නියමිත ගමන් මාර්ගය වෙනස් කර, ගමන් කිරීමේ දී අනතුරකට පත් වී ඇත.'' මෙහි දී රක්ෂණ වන්දි ලබා ගත හැකි ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 02යි)
(ආ) සවුලදායි සන්නිවේදනය ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට ඉවහල් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(iii) නිමාලි, රිදී හා මැණික් ආභරණ නිපදවා අපනයනය කිරීමට අදහස් කරන අතර, ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ඔබගෙන් අපේක්ෂා කෙරේ. එම භාණ්ඩ අපනයනය කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ මෑත කාලීන ප්‍රවණතාවක් ලෙස අධිවේගී මාර්ග සංකල්පය ව්‍යාප්ත වෙමින් පවතී. ව්‍යාපාර අධ්‍යයනය හැදෑරූ අයකු ලෙස ව්‍යාපාරික දෘෂ්ටි කෝණයෙන් අධිවේගී මාර්ග පිළිබඳ ඇගයීමක යෙදෙන්න. (ලකුණු 04යි)

(v) (අ) විදේශ වෙළෙඳාමේ උන්නතියට එරෙහිව බලපාන සාධක නම් කරන්න. (ලකුණු 02යි)
(ආ) විදේශ වෙළෙඳාමේ උන්නතිය සඳහා වන බාධා අවම කිරීමේ අරමුණින් පිහිටුවා ගෙන ඇති ජාත්‍යන්තර සංවිධාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි)
(මුළු ලකුණු 20යි)

## II කොටස

**5.** (i) (අ) කළමනාකරුගේ කාර්යයන් හෙන්රි මින්ස්බර්ග් ගේ (HENRY MINTZBERG) වර්ගීකරණයට අනුව දක්වන්න. (ලකුණු 02යි)
(ආ) කළමනාකරුවකු ප්‍රගුණ කර ගත යුතු සාමාන්‍ය කුසලතා සහ විශේෂ කුසලතා වෙන වෙන ම දක්වන්න. (ලකුණු 02යි)

(ii) (අ) පාසලක සාර්ථක කළමනාකාරිත්වයක් පවත්වා ගෙන යාමට වඩා වැදගත් වන්නේ, ''ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය ද? නොඑසේ නම් ඒකාධිපති නායකත්ව ශෛලිය ද ?'' ඔබේ පිළිතුර හේතු සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 02යි)
(ආ) කළමනාකරණ ක්‍රියාවලියේ මූලික කාර්යයන් දක්වා, ඒවායේ උප කාර්යයන් **දෙක** බැගින් වෙන වෙන ම දක්වන්න. (ලකුණු 02යි)

(iii) (අ) සැලසුම්කරණයේ මූලධර්ම **හතරක්** දක්වන්න. (ලකුණු02යි)
(ආ) දෙපාර්තමේන්තුකරණය කළ හැකි පදනම් **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(iv) (අ) කාණ්ඩ සහ ප්‍රවාහ නිෂ්පාදනයේ ලක්ෂණ **දෙක බැගින්** වෙන් වෙන් ව දක්වන්න. (ලකුණු 02යි)
(ආ) මෙහෙයුම් ක්‍රියාවලියට යොදා ගන්නා නව තාක්ෂණ ක්‍රම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි)

(v) (අ) නිෂ්පාදන පාලනයේ ක්ෂේත්‍ර **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි)
(ආ) නිෂ්පාදිතයක ගුණාත්වය පරීක්ෂා කරන ප්‍රධාන ක්‍රම **හතරක්** දක්වන්න. (ලකුණු 02යි)
(මුළු ලකුණු 20යි)

[3 වැනි පිටුව බලන්න

**6.** (i) (අ) ඵලදායීතාවය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02යි)

(ආ) ඵලදායීතාවය මැනීමට යොදා ගන්නා සමීකරණය දක්වා, එමගින් ලැබෙන පිළිතුර ඇගයීමකට ලක් කරන ආකාරය ද පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ii) නිෂ්පාදන ආයතනයක අවශ්‍ය ප්‍රමාණයට වඩා තොග පැවතීම නිසා මුහුණ පෑමට සිදුවන **අවාසි** දායක තත්ත්වයන් **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) (අ) ව්‍යාපාරයක ඉලක්ක වෙත ගමන් කිරීමට අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් අතර පවතින අන්තර් සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 02යි)
(ආ) ප්‍රවර්ධන මිශ්‍රයේ උපකරණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iv) මූල්‍ය කළමනාකරණ තීරණ, ගැලීම් සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) (අ) ඕනෑම ව්‍යාපාර සංවිධානයකට වුව ද මූල්‍ය අවශ්‍යතා පුරෝකථනය කිරීම වැදගත් වේ. යෝග්‍ය මූල්‍ය සම්පාදන මාර්ග තීරණය කිරීමේ දී මූල්‍ය කළමණාකරුවන් යොදා ගන්නා ඍජු මූල්‍ය සම්පාදන මාර්ග **දෙකක්** හා වක්‍ර මූල්‍ය සම්පාදන මාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)
(ආ) ව්‍යාපාර ආයතනයක මූල්‍ය අනුපාත විශ්ලේෂණ මගින් හඳුනාගත හැකි ප්‍රධාන ක්ෂේත්‍ර නම් කරන්න. (ලකුණු 02යි)
(මුළු ලකුණු 20යි)

**7.** (i) (අ) සීමා සහිත සමාගමකට ලබා ගත හැකි අභ්‍යන්තර මූල්‍ය මාර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 02යි)
(ආ) දෙමුහුන් මූල්‍යයනය (Hybrid Finance) යනු කුමක් ද? (ලකුණු 02යි)

(ii) (අ) කොළඹ කොටස් වෙළෙඳපොළේ වැදගත්කම අගයන්න. (ලකුණු 02යි)
(ආ) සීමිත සමාගමක්, ලාභාංශ තීරණය කිරීමේ දී සලකා බලන සාධක නම් කරන්න. (ලකුණු 02යි)

(iii) ව්‍යාපාර ආයතනයක් අනාගත මානව සම්පත් අවශ්‍යතා පුරෝකථනය කිරීමේ දී සලකා බලන කරුණු මොනවාදැ යි නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) (අ) ඔබ ඇඟළුම් ආයතනයක මානව සම්පත් කළමනාකරුවකු නම්, ආයතනයට සේවිකාවන් බඳවා ගැනීම සඳහා රැකියා දැන්වීමක් පළ කිරීමේ දී ඇතුළත් කළ යුතු තොරතුරු නම් කරන්න. (ලකුණු 02යි)
(ආ) සේවකයන් බඳවා ගැනීමේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය කවර ලෙසින් සූදානම් විය යුතු ද? (ලකුණු 02යි)

(v) ව්‍යාපාර ආයතනයක යහපත් සේව්‍ය-සේවක සම්බන්ධතාවල වැදගත්කම අගයන්න. (ලකුණු 04යි)
(මුළු ලකුණු 20යි)

**8.** (i) දත්ත සැකසුම් ක්‍රියාවලියේ කාර්යයන් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) පරිගණක ජාලයක (Computer Network) පරිගණක එකිනෙකට සම්බන්ධ වී ඇති ආකාරය අනුව ජාල වර්ග කිහිපයක් හඳුනා ගත හැකිය. ජාල වර්ග **හතරක්** නම් කර, පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) විවිධ සංවිධානම ය මට්ටම්වල යොදා ගැනෙන ප්‍රධාන තොරතුරු පද්ධති **හතර** සඳහන් කර එම පද්ධති භාවිත කරන පාර්ශව නම් කරන්න. (ලකුණු 04යි)

(iv) (අ) ''ව්‍යාපාර සැලැස්මක් සකස් කරනුයේ ව්‍යාපාරයේ අභ්‍යන්තර අවශ්‍යතා ඉටු කර ගැනීමට පමණක් නොවේ.'' පැහැදිලි කරන්න. (ලකුණු 02යි)
(ආ) ව්‍යාපාර සැලැස්මක සමාගම් සාරාංශය තුළ ඇතුළත් කරනු ලබන කරුණු මොනවා ද? (ලකුණු 02යි)

(v) (අ) ව්‍යාපාර සැලැස්මක යෝජිත අලෙවි උපාය මාර්ග සඳහා ඇතුළත් විය යුතු තොරතුරු **හතරක්** දක්වන්න. (ලකුණු 02යි)
(ආ) ව්‍යාපාර සැලැස්මක, මූල්‍ය සැලැස්මේ අන්තර්ගත කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)
(මුළු ලකුණු 20යි)

***